සියලු ම හිමිකම් ඇව්රිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2019 ජූලි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2019-07-20
පෙරවරු
[8.45 – 12.00]

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 09

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය ආකෘති රාමුව මඟින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුකරනු ලබන උපකල්පනය හඳුනාගනු ලබයි. එමෙන්ම සංකල්පමය ආකෘති රාමුව මඟින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට අදාල මූලිකාංග නිර්වචනය, හඳුනාගැනීම සහ මැනීම ද සිදුකරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංකල්පමය ආකෘති රාමුව අනුව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී අනුගමනය කරනු ලබන උපකල්පනය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) වගකීමක් (liability) හඳුනාගැනීම සඳහා වූ නිර්ණායකය (recognition criteria) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

සංකලිත වාර්තාකරණය (Integrated reporting) මඟින් වටිනාකම් (value) නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා සංවිධානයක විවිධ ආකාරයේ ප්‍රාග්ධනයන් දායක වන්නේ කෙසේද යන්න පිළිබඳව පැහැදිලි කරයි. තවද, සංකලිත වාර්තාවක මූලික වශයෙන් එකිනෙකට සම්බන්ධ වූ සංරචක අටක් ඇතුලත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සංකලිත වාර්තාවක ඇතුලත් ප්‍රධාන සංරචක පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

(a) වත්කමක්, අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනීමට සම්පූර්ණ විය යුතු නිර්ණායකයක් **සඳහන් කරන්න**.
(ලකුණු 02)

(b) **සීමාසහිත EPL සමාගම,** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී නව නිෂ්පාදිතයක සංවර්ධන කටයුතු සිදුකරන ලද අතර, 2019 මැයි මාසයේදී එහි වාණිජමය මෙහෙයුම් ආරම්භ කරන ලදී. 2018/19 වර්ෂය තුළදී සමාගම විසින් මෙම නව නිෂ්පාදිතය සඳහා පහත සඳහන් පිරිවැය දරණ ලදී:

(1) වර්ෂය තුළදී නව නිෂ්පාදිතය සඳහා පර්යේෂණයක් සිදුකළ අතර, ඒ සඳහා රු. මිලියන 1 ක පිරිවැයක් දරණ ලදී.

(2) වර්ෂය තුළදී සමාගම විසින් නව නිෂ්පාදිතය සඳහා පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කරන ලද අතර, ඒ සඳහා ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු.100,000/- ක් දරණ ලදී.

(3) නව නිෂ්පාදිතයේ වෙළෙඳ ප්‍රචාරණ සහ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් රු.300,000/- ක මුදලක් දරණ ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 38 (LKAS - 38), අස්පෘශ්‍ය වත්කම් අනුව ඉහත සඳහන් එක් එක් පිරිවැය අයිතමය අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගත හැකිද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)
(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත ලංකා ටීස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනයන්ට පිළියෙළ කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලද ශේෂ පහත පරිදි වේ:

| මාර්තු 31 දිනට | 2019 | 2018 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට) | 2,000,000 | 1,800,000 |
| සමුච්චිත ක්ෂයවීම් | (1,400,000) | (1,500,000) |
| අස්පෘශ්‍ය වත්කම් | 35,000 | - |
| වෙනත් සමාගම්වල ආයෝජන (පිරිවැයට) | 165,000 | - |
| | **800,000** | **300,000** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 65,000 | 90,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 17,000 | 21,000 |
| | **82,000** | **111,000** |
| **මුළු වත්කම්** | **882,000** | **411,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ක්ෂය වීම් රු.500,000/- කි.

(2) 2019 මාර්තු 31 දින මෝටර් වාහනයක් මුදලට විකුණන ලදී. එම මෝටර් වාහනයේ පිරිවැය සහ 2019 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.1,200,000/- ක් සහ රු.600,000/- ක් විය. මෙම මෝටර් වාහනය විකිණීමෙන් ලැබූ ලාභය රු.200,000/- කි.

(3) සමාගම විසින් 2019 මාර්තු 31 දින නව මෝටර් වාහනයක් අත්පත් කරගන්නා ලදී.

(4) 2019 මාර්තු 31 දින අත්පත් කරගනු ලැබූ පේටන්ට් බලපත්‍රයේ වටිනාකම අස්පෘශ්‍ය වත්කම්වලින් නිරූපණය වේ.

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ලංකා ටීස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත සැබ්කෝ සමාගමේ** 2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයන්** *(රු.'000)*

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 මාර්තු 31 |
|---|---|
| පිරිවැටුම | 220,700 |
| විකුණුම් පිරිවැය | 143,780 |
| දළ ලාභය | 76,920 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 34,760 |
| ආදායම් බදුවලට පසු ලාභය | 16,177 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්** *(රු.'000)*

| දිනට | 2019 මාර්තු 31 | 2018 මාර්තු 31 |
|---|---|---|
| තොග | 25,250 | 16,400 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 27,580 | 19,850 |
| ස්කන්ධය | 125,600 | 118,000 |
| දිගුකාලීන ණය | 12,000 | 15,600 |

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ණයගැති එකතුකිරීමේ කාලය.

(iii) තොග නේවාසික කාලය.

(iv) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ [Return on Capital Employed (ROCE)] අනුපාතය. (ලකුණු 06)

(b) පහත සඳහන් අනුපාතයන් තවදුරටත් වැඩිදියුණු කිරීමට හේතුවිය හැකි කරුණු දෙක(02) බැගින් **ලැයිස්තුගත කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ණයගැති එකතුකිරීමේ කාලය. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සීමාසහිත යුරෝපා කොලිටි ෆුඩ්ස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනට සහ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ:

**සීමාසහිත යුරෝපා කොලිටි ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| **මාර්තු 31 දිනට** | **2019** | **2018** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 22,050 | 22,300 |
| සමුච්චිත ක්ෂයවීම් | (10,090) | (10,020) |
| **ධාරණ අගය** | **11,960** | **12,280** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 5,935 | 3,320 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 10,920 | 11,580 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,205 | 2,560 |
| | **19,060** | **17,460** |
| **මුළු වත්කම්** | **31,020** | **29,740** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 10,000 | 10,000 |
| රඳවාගත් ඉපැයීම් | 16,270 | 13,820 |
| | **26,270** | **23,820** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,000 | - |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 540 | 490 |
| | **1,540** | **490** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,040 | 980 |
| කෙටිකාලීන ණය | 1,800 | 3,425 |
| ගෙවිය යුතු පොලී | 220 | 75 |
| ගෙවිය යුතු ආදායම් බදු | 150 | 950 |
| | **3,210** | **5,430** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **31,020** | **29,740** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දින මෝටර් වාහනයක් රු.600,000/- කට විකුණන ලදී. මෝටර් වාහනයේ පිරිවැය රු.750,000/- ක් වූ අතර, එහි ඉවත් කළ දිනට ධාරණ අගය රු.350,000/- ක් විය.

(2) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොලී වියදම රු.590,000/- කි.

(3) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල සමාගමේ ආදායම් බදු වියදම රු.125,000/- කි.

(4) වර්ෂය තුළදී පාරිතෝෂික ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි.

(5) වර්ෂය තුළදී ලාභාංශ ගෙවා හෝ ප්‍රකාශයට පත්කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත යුරෝපා කොලිටි ෆුඩ්ස් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය</u> යටතේ **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(A) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත X සමාගමේ** ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

(1)

| අයිතමය | ගිණුම්කරණ ධාරණ අගය (ලියාහළ අගය) (රු.) | බදු පදනම (රු.) |
|---|---:|---:|
| ගොඩනැගිලි | 6,000,000 | 5,000,000 |
| වාහන | 2,500,000 | 2,000,000 |

(2) 2018 අප්‍රේල් 01 දිනට විලම්භිත බදු වත්කම් / වගකීම් ගිණුමේ ශේෂයක් නොවීය.

(3) 2019 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා වෙන්කිරීම රු.700,000/- කි.

(4) **සීමාසහිත X සමාගමට** අදාල බදු ප්‍රතිශතය 28% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2019 මාර්තු 31 දිනට තාවකාලික වෙනස්කම් (temporary differences) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) 2019 මාර්තු 31 දිනට විලම්භිත බදු වත්කම / වගකීම **ගණනය කරන්න**. (ලකුණු 02)

(B) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාසයට අදාලව පහත සඳහන් තොග පිළිබඳ තොරතුරු **සීමාසහිත ඩෙල්ටා සමාගමේ** ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදි:

- 2018 දෙසැම්බර් 01 දිනට තිබූ තොග ඒකක ගණන 2,000 කි. ඒකකයක පිරිවැය රු.10/- ක් විය.
- මාසය තුළ ලැබීම්:
  - 2018 දෙසැම්බර් 15 - ඒකකයක පිරිවැය රු.9.30 බැගින් ඒකක 5,000
  - 2018 දෙසැම්බර් 20 - ඒකකයක පිරිවැය රු.11/- බැගින් ඒකක 6,000
- මාසය තුළ නිකුත් කිරීම්:
  - 2018 දෙසැම්බර් 16 - ඒකක 4,000
  - 2018 දෙසැම්බර් 25 - ඒකක 7,000

**ඔබ විසින් කළ යුතු දෑ:**

බර තැබූ සාමාන්‍ය පිරිවැය [Weighted Average Cost (WAC)] ක්‍රමය භාවිතයෙන්, 2018 දෙසැම්බර් 31 දිනට අවසන් තොගයේ වටිනාකම **ගණනය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ඔමේගා පොදු සමාගමේ,** 2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**සීමාසහිත ඔමේගා පොදු සමාගම**

**2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට):** | | |
| ඉඩම | 50,000 | |
| ගොඩනැගිලි | 25,000 | |
| මෝටර් වාහන | 21,000 | |
| කාර්යාල උපකරණ | 7,200 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 7,600 | |
| **2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 8,500 |
| මෝටර් වාහන | | 11,500 |
| කාර්යාල උපකරණ | | 2,200 |
| ඉදිරියට කළ ගෙවීම් | 240 | |
| 2019 මාර්තු 31 දිනට තොගය | 41,500 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 800,000) | | 80,000 |
| 2018 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 6,450 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 2,100 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 24,520 | 31,200 |
| අතැ'ති මුදල් සහ බැංකුවේ මුදල් | 3,280 | |
| ගෙවූ ආදායම් බදු | 800 | |
| අතුරු ලාභාංශ ගෙවීම් - සාමාන්‍ය කොටස් | 4,000 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 192,300 | 274,500 |
| වෙනත් ආදායම් | | 2,900 |
| 2017/18 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | | 650 |
| පරිපාලන වියදම් | 32,700 | |
| බෙදාහැරීමේ වියදම් | 13,980 | |
| මූල්‍ය වියදම් | 1,400 | |
| 2018 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 520 |
| බැංකු ණය | | 5,000 |
| | **425,520** | **425,520** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට පැවති තොගයේ ඇතුලත් රු.3,500,000/- ක් පිරිවැය වූ තොග හානියට පත්වී ඇත. මෙම තොගයේ ශුද්ධ උපලබ්ධි වටිනාකම රු.2,800,000/- ක් වූ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ගිණුම් පොත්වල සිදුකර නොතිබුණි.

(2) ප්‍රත්‍යාගණිත සංචිත ගිණුමේ සඳහන් රු.2,100,000/- ක සම්පූර්ණ ශේෂය මීට වර්ෂ 03 කට පෙර ප්‍රත්‍යාගණනය කරන ලද ඉඩම් සඳහා අදාල වේ. 2019 මාර්තු 31 දින සිදුකරන ලද ප්‍රත්‍යාගණනයේදී ඉඩම්වල වටිනාකම රු.3,000,000/- කින් ඉහළ ගොස් ඇති බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ගිණුම් පොත්වල සිදුකර නොතිබුණි.

(3) 2018 සැප්තැම්බර් 30 දින, සමාගම භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිත කළ වෑන් රථයක් රු.2,900,000/- කට විකුණන ලදී. මෙම වෑන් රථය 2015 අප්‍රේල් 01 දින රු.4,500,000/- ක පිරිවැයකට මිලට ගන්නා ලදී. වෑන් රථය විකිණීමෙන් ලද මුළු මුදල, මුදල් පොතට හර කර, වෙනත් ආදායම් ගිණුමට බැර කර ඇති අතර, මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් වාර්තාකර නොතිබුණි.

(4) දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීව කාලය පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 20 |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 10 |

(5) 2018/19 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ආදායම් බදු වගකීම රු.900,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(6) සමාගමට රු.420,000/- අයවිය යුතුව තිබූ ගනුදෙනුකරුවෙක් 2019 මාර්තු 31 දින බංකොලොත්භාවයට පත්ව ඇති බව සමාගම වෙත දැනගැනීමට ලැබුණි. මෙම ගනුදෙනුකරුට අදාල ශේෂය සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයක් පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි සිදුකර තිබුණි. 2019 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා 2% ක පොදු වෙන්කිරීමක් සිදුකළ යුතුව ඇත.

(7) 2018 අප්‍රේල් 01 දින නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාගම විසින් 10% වාර්ෂික පොළී අනුපාතිකයක් යටතේ රු. මිලියන 5 ක බැංකු ණයක් ලබාගන්නා ලදී. 2019 මාර්තු 31 දිනට කර්මාන්ත ශාලාව ඉදිකෙරෙමින් පැවති අතර, 2019 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත වේ. ගොඩනැගිල්ල ඉදිකිරීමට දැරූ පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමේ වාර්තා කර ඇත. තවද මෙම ණය මුදල සඳහා නැවත ගෙවීම් කිසිවක් සිදුකර නොමැති අතර, ණය මුදල මත වර්ෂයට අදාල පොලිය, මූල්‍ය වියදම් ගිණුම හර කර වෙළෙඳ ගෙවිය යුතු මුදල් ගිණුමට බැර කොට තිබුණි. 2019 මාර්තු 31 දිනට පැවති ණය මුදලෙන් ¼ ක් ඊළඟ වර්ෂය තුළදී පියවිය යුතු වේ.

(8) ඉදිරියට කළ ගෙවීම් ගිණුමේ ශේෂයේ 2019 ලිත් වර්ෂයට අදාලව සිදුකරන ලද කුලී ගෙවීම් නිරූපණය වේ.

(9) 2019 අප්‍රේල් 15 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2019 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු.2/- බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

(10) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජූනි 02 දින, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

ඉහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ඔමේගා පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) 2018 අප්‍රේල් 01 දින, **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමේ** 1,000,000 (මිලියන 1) ක් වූ සාමාන්‍ය කොටස්වලින් 75% ක් රු. මිලියන 290 කට අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගත් දිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය රු. මිලියන.340 කි. 2018 අප්‍රේල් 01 දිනට, **සීමාසහිත බීටා පොදු සමාගමේ** කොටසක වෙළෙඳපොළ වටිනාකම රු.365/- කි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** සහ **සීමාසහිත බීටා පොදු සමාගමේ** විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත දැක්වේ:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** | **සීමාසහිත බීටා පොදු සමාගමේ** |
|---|---|---|
| විකුණුම් | 250,000 | 150,000 |
| විකුණුම් පිරිවැය | (150,000) | (90,000) |
| **දළ ලාභය** | **100,000** | **60,000** |
| | | |
| **වෙනත් ආදායම්:** | | |
| පොලී ආදායම | 1,200 | 950 |
| ලාභාංශ ආදායම | 500 | - |
| වෙනත් ආදායම් | 150 | 1,250 |
| | **101,850** | **62,200** |
| **වියදම්:** | | |
| බෙදාහැරීමේ වියදම් | (12,000) | (7,000) |
| පරිපාලන වියදම් | (60,000) | (46,000) |
| මූල්‍ය වියදම් | (6,000) | (4,000) |
| **බදු පෙර ලාභය** | **23,850** | **5,200** |
| ආදායම් බදු වියදම | (6,500) | (1,550) |
| **වර්ෂය සඳහා ලාභය** | **17,350** | **3,650** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **17,350** | **3,650** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** පිරිවැය රු.5,000,000/- ක් වූ භාණ්ඩ පිරිවැය මත 10% ක ලාභාන්තිකයක් සහිතව විකුණන ලදී. **සීමාසහිත බීටා පොදු සමාගමේ** 2019 මාර්තු 31 දිනට පැවති අවසන් තොගය තුළ **සීමාසහිත සිග්මා පොදු සමාගමෙන්** මිලට ගත් රු.1,100,000/- ක් වටිනා භාණ්ඩ ඇතුලත් වේ.

(2) මීට වර්ෂ දෙකකට ඉහතදී, **සීමාසහිත බීටා පොදු සමාගම, සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් නිකුත් කරන ලද ණයකරවල රු.5,000,000/- ක් ආයෝජනය කරන ලදී. මෙම ණයකරවල වාර්ෂික පොලී අනුපාතය 10% ක් වන අතර, කල්පිරීමේ කාලය වර්ෂ 05 කි. වර්ෂය සඳහා මෙම ණයකර මත ලැබූ පොලී ආදායම, **සීමාසහිත බීටා පොදු සමාගමේ** පොලී ආදායමේ ඇතුලත්ව ඇත.

(3) **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** අයත් ගබඩා පරිශ්‍රය 2018 අප්‍රේල් 01 දින සිට, භාවිත කරන අතර, ඒ සඳහා රු.50,000/- ක වාර්ෂික කුලියක් **සීමාසහිත සිග්මා පොදු සමාගම** විසින් **සීමාසහිත බීටා පොදු සමාගමට** ගෙවන ලදී.

(4) 2018 අප්‍රේල් 01 දින, **සීමාසහිත බීටා පොදු සමාගම** විසින්, **සීමාසහිත සිග්මා පොදු සමාගමට** යන්ත්‍රයක් රු.5,000,000/- කට විකුණන ලදී. එදිනට **සීමාසහිත බීටා පොදු සමාගමේ** පොත්වල එම යන්ත්‍රයේ ධාරණ අගය රු.4,000,000/- ක් ලෙස දක්වා තිබුණි. 2018 අප්‍රේල් 01 දිනට මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 10 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී පැන නගින කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සිග්මා පොදු සමාගමේ** ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 14)

(B) අනුපාත විශ්ලේෂණයේ පවතින සීමාවන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |